දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650
011-2136700

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011- 2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info @psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/13/59/2023

ඔබේ අංකය / உமது இல. / Your No.: HA/3/7/26-3

දිනය / திகதி / Date: 2023.12. 01

ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**පරිපාලන ග්‍රාම නිලධාරි 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ ඔබගේ සමාංක හා 2023.11.23 හා 2023.11.24 දිනැති ලිපි හා බැඳේ.

02. පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ 2024 වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

03. ඒ අනුව 2024 වර්ෂයේ එකී ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලෙසත්, නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි.

04. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය දන්වා එවීමට කටයුතු නොකරනු ලබන අතර, මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

05. වාර්ෂික ස්ථාන මාරු නියෝග පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා කිරීමට අපේක්ෂා කරන නිලධාරීන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකර ඇති ස්ථාන මාරුවීම් නියෝග හා ඊට අදාළ ආවරණ ලිපිය භාවිතා කර 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව එම අධිකාරය වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය. එසේ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා ඉදිරිපත් කරන නිලධාරීන්, එම අධිකාරයේ තීරණය ලැබෙන තෙක් නොසිට නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා කළ යුතුය.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි නව සේවා ස්ථාන වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු සම්බන්ධයෙන් එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

Ndaya

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
**ලේකම්**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

පරිපාලන ග්‍රාම නිලධාරි වාර්ෂික ස්ථානමාරු අභියාචනා **2024** - රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ

| අනු අංකය | නිළධාරියාගේ නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබී ඇති ස්ථානය | අභියාචනය මගින් ඉල්ලා සිටිනු ලබන සහනය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය | ඒ සඳහා පාදක කරගත් හේතු |
|---|---|---|---|---|---|---|
| 1 | එස්.එම්.එස්. සිසිර කුමාර මහතා | මහර ප්‍රා.ලේ. කාර්යාලය | කඩුවෙල ප්‍රා.ලේ. කාර්යාලය | 1. කැළණිය ප්‍රා.ලේ. කාර්යාලයට ස්ථාන මාරු ලබා ගැනීම.<br><br>2. නැතහොත් 2024.12.31 දක්වා වර්තමාන සේවා ස්ථානයේ සේවය කිරීමට ඉඩදීම. | අභියාචනය නිශ්ප්‍රභ කිරීම. | අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, ඔහුව ස්ථාන මාරු කර ඇති සේවා ස්ථානයට ස්ථිර පදිංචියේ සිට ඇති දුර 20 Km ක් පමණ වීම මත එයද දුෂ්කර සේවා ස්ථානයක් ලෙස සැළකිය නොහැකි වීම සහ අනුප්‍රාප්තික නිලධාරියා අගතියට පත්වීම වැලැක්වීම. |
| 2 | එල්.පි.ජී.එස්. පුෂ්ප කුමාර මහතා | දමන ප්‍රා.ලේ. කාර්යාලය | ඉරක්කාමම් ප්‍රා.ලේ. කාර්යාලය | 1. වාර්ෂික ස්ථාන මාරු 2024 යටතේ අමාතාංශ මාරු මණ්ඩලය මගින් අම්පාර ප්‍රා.ලේ.කාර්යාලය වෙත ලබා දී තිබූ ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීම.<br><br>2. නොමැතිනම් උහන ප්‍රා.ලේ.කාර්යාලය වෙත ස්ථීන මාරුව ලබා ගැනීම.<br><br>3. ඉරක්කාමම් ප්‍රා.ලේ.කාර්යාලය වෙත ලබා දී ඇති ස්ථාන මාරුව අවලංගු කර දමන කාර්යාලයම ලබා දීම. | අභියාචනය මගින් ඉල්ලා ඇති පරිදි අභියාචක ස්ථානමාරු කර ඇති සේවා ස්ථානය අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලෙස සංශෝධනය කිරීම. | – |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3 | එච්.පී. අයි. යසරත්න මහතා | ඉරක්කාමම් ප්‍රා.ලේ. කාර්යාලය | අම්පාර ප්‍රා.ලේ. කාර්යාලය | අයදුම් කර ඇති පරිදි නිවසට ආසන්න අම්පාර ප්‍රා.ලේ. කාර්යාලය වෙත ස්ථාන මාරුව ලබා දීම. | අභියාචනය නිශ්ප්‍රභ කිරීම. | අභියාචක විසින් ඉදිරිපත් කර ඇති වෛද්‍ය හේතූන් ස්ථාන මාරුව ලබා දීමට තරම් ප්‍රමාණවත් නොවීම සහ ස්ථාන මාරු චක්‍රයේ අනෙකුත් නිලධාරීන් අගතියට පත්වීම වැලැක්වීම. |
| 4 | ඒ වී. රත්නායක මහත්මිය | තිහගොඩ ප්‍රා.ලේ. කාර්යාලය | දෙවිනුවර ප්‍රා.ලේ. කාර්යාලය | ස්ථාන මාරුව සංශෝධනය කර මාතර ප්‍රා.ලේ. කාර්යාලය ස්ථාන මාරුව ලබා දීම. | මීළඟ වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී සළකා බැලීමට යටත්ව අභියාචනය නිශ්ප්‍රභ කිරීම. | අභියාචකගේ ස්ථාන මාරු අයදුම් පත්‍රයේ තෙවන මනාපය වෙත ස්ථාන මාරු කර තිබීම. |
| 5 | ඩබ්.ඒ.කේ. ජයන්ත මහතා | කඹුරුපිටිය ප්‍රා.ලේ. කාර්යාලය | මුලටියන ප්‍රා.ලේ. කාර්යාලය | කඹුරුපිටිය ප්‍රා.ලේ.කාර්යාලයම ස්ථාන මාරුව ලබා ගැනීම | අභියාචනයට ඉඩ ලබා දී ස්ථාන මාරුව අවලංගු කිරීම. | – |
| 6 | ඩබ්.එම්.එස්. ධර්ම කීර්ති මහතා | මැදවච්චි ප්‍රා.ලේ. කාර්යාලය | මහවිලච්චි ප්‍රා.ලේ. කාර්යාලය | ස්ථාන මාරුව අවලංගු කිරීම. | අභියාචනයට ඉඩ ලබා දී ස්ථාන මාරුව අවලංගු කිරීම. | – |
| 7 | එම්.කේ. එස්.මුණවීර මහතා | රාජාංගනය ප්‍රා.ලේ. කාර්යාලය | තඹුත්තේගම ප්‍රා.ලේ.කාර්යාලය | වර්ෂයක කාලයක් ස්ථාන මාරුව අවලංගු කිරීම. | අභියාචනය නිශ්ප්‍රභ කිරීම. | අභියාචක වර්තමාන සේවා ස්ථානයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරු වලට යටත් නිලධාරියෙකු වීම. |